

මහාචාර්ය එස්. වීරතුංග මහතා

## මහාචාර්ය සැම්සන් විරතුංග

පූජ්‍ය ආචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි

උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්ම ජීවිනො අප්පමත්තස්ස
යසොභිවඩ්ඪති

(ධම්ම පදය අප්පමාද වග්ගය)

*"උත්සාහයෙන්, සිහියෙන්, නිවැරදි කර්මාන්තයන්ගෙන්, දමුණු ඉඳුරන්ගෙන් යුක්තව, දහැමින් දිවි ගෙවන අප්‍රමාදියාගේ යසස වර්ධනය වේ"* යනුවෙන් ධම්මපදයේ අප්‍රමාද වග්ගයේ සඳහන් වන ආකාරයට අප කථා කිරීමට බලාපොරොත්තු වන කථා නායකයා ද උත්සාහයෙන් තම ජීවිතය සාර්ථක කරගෙන කීර්තිය පතුරුවමින් තම දැනුමෙන් අන් අය පෝෂණය කරමින් සිය දහස් ගණනකගේ නෙත් විවර කළ අනුදාර විද්වතෙකි. ඔහු නමින් සැම්සන් විරතුංග ය.

සෙංකඩගල පුරවරයේ නුවර පලාතෙන් පැවත එන පරපුරක කෙනෙකු වන සැම්සන් විරතුංග විද්වතාණන්ගේ පියා නමින් බෙනට් විරතුංග නම් විය. මව ඇග්නස් විරතුංග නම් වූවා ය. විලියම් බෙනට් විරතුංග මහතා නීතිඥ ආයතනයක සේවය කරමින් සිට පසුව ලංකා ගමනාගමන සේවයට (C.T.B.) බැඳී විශ්‍රාම ගිය අයෙකි. බෙනට් විරතුංග මහතා රැකියාව ලැබීමෙන් පසු සිය නෑදෑයන්ගෙන් වෙන් වී සිය බිරිය වන ඇග්නස් විරතුංග මහත්මිය සමග කොළඹ පැමිණීමෙන් පසුව ඇතුල්කෝට්ටේ ජීවත් වී ඇත. ඥාති පිරිස තව ම මුල්ගම්පොල පදිංචිකරුවෝ වෙති.

විලියම් බෙනට් විරතුංග මහතා හා ඇග්නස් විරතුංග දෙපළ ඇතුල්කෝට්ටේ පදිංචි වීමෙන් කලකට පසු එනම් 1931 සැප්තැම්බර් 26 වන දින මහරගම දී උපත ලද දරුවා අප කතා කරන සැම්සන් විරතුංගයන්ය. ඉගෙනීමට දක්ෂකම් දැක්වූ සැම්සන් විරතුංග දරුවා මූලික අධ්‍යාපනය ලැබීම සඳහා නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයට ඇතුළු විය. එම විද්‍යාලයෙහි හොඳින් අධ්‍යාපනය ලබා